# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1860/9 - 2014 අප්‍රේල් මස 30 වැනි බදාදා - 2014.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්ජී/2222.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ පිහිඹියගොල්ලෑව ජල කුළුණ සහ නිල නිවස ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ බදු අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1022.

### උපලේඛනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 81 පිහිඹියගොල්ලෑව ග්‍රාම නිලධාරී වසමේ පිහිඹියගොල්ලෑව ගමේ පිහිටි පිහිඹියගොල්ලෑව පොදු සුසාන භූමියට යාබද ඉඩම් කොටසෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 2ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම ; |
| *නැගෙනහිරට* | : | රජයේ කැලය (සුසාන භූමිය) ; |
| *දකුණට* | : | මැදවච්චිය - හොරොව්පතාන පාර හා රක්ෂිතය ; |
| *බටහිරට* | : | මෙත්තානන්ද මහතාගේ ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන බලපත්‍රලාභියාගේ නම සහ ලිපිනය* : 01. සමරසිරි රාජකරුණා මයා, පිහිඹියගොල්ලෑව.

05-421


1A - G 19479— 65 (2014/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*